(ආ) සදාචාර සම්පන්න දේශපාලන වැඩපිළිවෙළට කැපවීම් සහිතව ක්‍රියා කිරීම සඳහා ජගත් කුමාර සුමිත්‍රආරච්චි මැතිතුමා සමඟ ඒකරාශී වූ ජන කොටස් අතර සාමූහිකත්වයක් ගොඩනැගීම හා ඊට අවශ්‍ය පහසුකම් සැලසීම;

(ඇ) ජගත් කුමාර මැතිතුමා සමඟ දේශපාලන, ආර්ථික, අධ්‍යාපනික හා සංස්කෘතික ආදී සියලු පොදු ක්‍රියාකාරකම්වල දී සමූහිකව ද තනි තනිවද උපරිම ශක්තියෙන් අනූනව සහභාගීත්වය හා වෙනත් අවශ්‍යතා මෙම පදනම සතු කුසලතාවන්ගෙන් උපරිම දායක වීම;

(ඈ) සෑම දරුවෙක් වෙනුවෙන් (For Every Child) යන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (Unicef) අරමුණු හා එකඟ වෙමින් ශ්‍රී ලාංකේය සිසු දරු දැරියන්ගේ විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඉ) සිසු දරු දැරියන්ගේ අධ්‍යාපනය, සමාජ සාරධර්ම සුරක්ෂිත කිරීම සහ පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩසටහන් සංවිධානය කිරීම හා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම;

(ඊ) ඉගෙනීම කේන්ද්‍රීය කරගත් අධ්‍යාපන කුසලතා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සහයෝගය, අනුග්‍රහය හා ආධාර ලබාදීම;

(උ) සමාජයේ අඩු ආදායම් ලාභී හා සුවිශේෂී ගැටලුවලට මුහුණ පා ඇති පවුල්වල සිසු දරු දැරියන්ගේ නිවාස ඇතුළු මූලික අවශ්‍යතා හඳුනාගනිමින් එම ගැටලු විසඳීමට අවශ්‍ය වැඩ කටයුතු සම්පාදනය කිරීම;

(ඌ) සුවිශේෂී දක්ෂතා පෙන්නුම් කරන දරු දැරියන්ගේ අධ්‍යාපන ප්‍රවර්ධනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය, ආධාර හා අනුබල ලබාදීම වෙනුවෙන් කැපවීම;

(එ) සිසු දරු දැරියන්ගේ සුබසෙත සඳහා සිදුකළ යුතු යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන කටයුතු සිදුකිරීම.

